යටිනුවර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-----------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.1,112,000 ක් වූ කැබ් රථයක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ කලින් ලද ආදායම් ගිණුම් ශේෂය රු.399,028 ක් වැඩියෙන් ද, වරෙන්තු ගාස්තු බිල් කිරීම් රු.133,717 ක් අඩුවෙන් ද, කර්මාන්ත 03 කට අදාළ ණයහිමි ශේෂය රු.167,210 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ඇ) | වර්ෂය තුළ ගෙවූ රු.3,170,966 ක ණය වාරික වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | ඉදිරියේ දී, එම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්ගත නොවූ, රු.400,000 ක වටිනාකමින් යුත් කර්මාන්ත 02 ක්, කර්මාන්ත ණයහිමි යටතේ පෙන්වා තිබූ අතර, මුදල් නොගෙවූ රු.398,595 ක වටිනාකමින් යුත් කර්මාන්ත 02 ක් ණයහිමි ලෙස හඳුනාගෙන නොතිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ දී, ලද රු.444,307 ක බදු මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කර ගත යුතු වේ. | ඉඩම් විකිණීම මත බදු මුදල හරස් සටහනක් මඟින් සමුච්චිත අරමුදලට බැර කර ඇත. |

| | | |
|---|---|---|
| (ඊ) 2011 වර්ෂය තුළ සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ ධූමායන යන්ත්‍රයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වේ. | වටිනාකම තක්සේරු කර ඉදිරියේ දී, ගිණුම්ගත කරමි. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයන් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.4,980,739 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීම කළ යුතු වේ. | ගිණුම සමඟ සසඳා ඉදිරියේ දී, නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් අයිතම 08 ක එකතු වටිනාකම රු.124,382,593 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.3,748,673 ක් වූ අතර, අවුරුදු 01 ත් අවුරුදු 05 ත් අතර කාලයක් තුළ හිඟ ගිණුම් ශේෂයන් හි එකතුව රු.63,109,684 ක් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු මුදලින් රු.21,913,136 ක් දැනට ලැබී ඇති අතර, ඉතිරි රු.102,469,457 ක මුදල ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,720,914 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් තුළ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් හි එකතුව රු.4,508,437 ක් වී තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | ගෙවිය යුතු මුදලින් රු.20,672,840 ක් පිළිතුරු ලබා දෙන දිනය වන විටත් ගෙවීම් කර ඇත. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීමෙ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඔප්පු හෝ පැවරුම් නියෝග, ණයගැති ලේඛන හා උපලේඛන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.14,470,540 ක් වූ ගිණුම් විෂයන් 02 ක් විගණනයේ දී, සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඔප්පු සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරන බවත්, විවිධ ණයගැති ශේෂයෙන් රු.473,640 ක් 2007 වර්ෂයේ සිට පැවත එන අතර, උපලේඛන සොයා ගත නොහැකි බවත් දන්වමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 571 | 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 120 කදී ලැබී තිබූ කර්මාන්ත අත රුඳවුම් තැන්පතු, නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| (i) | 19 වගන්තිය | සියලුම උපපත්‍රිකා සහිත පොත් සභාවේ ලේකම්වරයා භාරයේ පැවතිය යුතු වුවත්, ඒවා ගබඩාව භාර නිලධාරියා භාරයේ පැවතුණි. | උපපත්‍රිකා සහිත පොත් සභාවේ ලේකම්වරයා භාරයේ තබා ගත යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බවට දන්වමි. |
| (ii) | 61 වගන්තිය | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීය සම්බන්ධ බදු ගෙවිය යුතු ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදු කර, ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කර, ලේඛනගත කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි ක්‍රමවේදයකට අනුව, ලේඛනගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) | 4.2(ඇ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී, නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරන කරමි. |
| (ii) | 4.2.2(අ) ඡේදය | ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී, නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත හා | වර්ෂ 05 කට වරක් නව වරිපනම් තක්සේරුවක් ක්‍රියාත්මක කළ යුතු වුව ද, 2006 වර්ෂයට පසු | වරිපනම් තක්සේරුව නිශ්චිත කාලය | 2018 ජූනි 14 දින නව තක්සේරුවක් සිදු කිරීමට කටයුතු කර |

| | | | |
|---|---|---|---|
| 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | නව තක්සේරුවක් සිදු කර නොතිබුණි. | අනුව සිදු කළ යුතු වේ. | ඇත. ඉදිරියේ දී නව තක්සේරුව මත බදු අය කරන බව දන්වමි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,551,386 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.42,381,202 ක්විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,469,560 | 3,461,239 | 3,063,167 | 2,944,787 | 4,780,560 | 4,833,422 | 5,086,060 | 3,534,914 |
| (ii) | කුලී | 250,000 | 201,665 | 201,665 | - | 240,000 | 87,000 | 87,000 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,400,000 | 1,558,800 | 1,558,800 | 11,145 | 2,450,000 | 2,268,350 | 2,268,350 | 11,145 |
| (iv) | වෙනත් ආදායම් | 46,450,000 | 38,068,405 | 9,694,359 | 94,478,179 | 49,758,520 | 40,494,541 | 19,449,172 | 65,549,527 |
| | එකතුව | 51,569,560 | 43,290,109 | 14,517,991 | 97,434,111 | 57,229,080 | 47,683,313 | 26,890,582 | 69,095,586 |

2.2.2 <u>වරිපනම් හා බදු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද වරිපනම් බදු රු.3,461,239 කින් රු.1,617,856 ක් හෙවත්, සියයට 47 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟය අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජංගම සේවා සහ රතු නිවේදන නිකුත් කරමින් බිල් හිඟය අඩු කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ වරිපනම් ශේෂය වූ රු.3,211,443 කින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,997,199 ක් හෙවත්, සියයට 62 ක් අය කර නොතිබුණි. | හිඟ හිටි වරිපනම් අය කර ගත යුතු වේ. | ආදායම් රැස් කිරීමේ වැඩසටහන් මඟින් හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | වර්ෂ 10 ත් 13 ත් අතර කාල පරිච්ඡේදයක සිට බිල් කරමින් පවතින රජයේ දේපළ 72 කින් අය විය යුතු වරිපනම් රු.960,020 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි වරිපනම් අය කර ගත යුතු වේ. | අදාළ රජයේ ආයතන දැනුවත් කළ ද, හිඟ ගෙවීමට කටයුතු කර නොමැත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,672,246 ක් හා රු.92,474,328 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගත යුතු වේ. | මුදල ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රතිපාදන නොසැලසීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ අයවැය තුළින් වෙන් කර නොගත්, රු.128,758 ක මුදලක් පොලි ගෙවීම සඳහා වියදම් කර තිබුණි. | අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගත යුතු වේ. | ඉදිරියේ දී, මෙවැනි වැරදීම් සිදු නොකරමි. |

(ආ) කර්තව්‍යයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයන් 02 කට වෙන් කළ රු.1,150,000 ක මුදලින් රු.943,918 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන අරමුණු අනුව, උපයෝජනය කළ යුතු වේ. | අදහස් දක්වා නැත |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ පොහොර ගබඩා කිරීම සඳහා කුටියක් සහ අට්ටි ක්‍රමයට කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට රු.1,000,000 ක මුදලක් අයවැය මඟින් වෙන් කර තිබුණ ද, අදාළ කාර්යය ඉටු කර නොතිබුණි. | කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා, මෙම වර්ෂය තුළ එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 **"න්‍යාය පත්‍රය"** ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයට අදාළ කාරණා පිළිබඳ සභාව අවධානය යොමු කළ යුතු වේ. | ඉදිරියේ දී, විශේෂ අවධානය යොමු කරන බව දන්වමි. |
| (ii) තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද, ඉලක්ක වෙත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමේ දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී දර්ශක හඳුනා ගෙන කටයුතු කරන බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පවතින L 20868, අංක 85317, අංක 85316 හා අංක රිට් 19/2015 දරන නඩුවලට අදාළ තීන්දු ප්‍රකාශ කර, දීර්ඝ කාලයක් ගත වී ඇතත්, නඩු තීන්දු ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් පිළිබඳ අධිකරණ නියෝග පරිදි කටයුතු කළ යුතු වේ. | නීති උපදෙස් පරිදි වහාම, කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේ දී, තනතුරු 08 ක පුරප්පාඩු 12 ක් පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩල සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | බඳවා ගැනීම් සඳහා අනුමැතිය මේ වන විට ඉල්ලා ඇත. |
| (ආ) මාස 06 සිට අවුරුදු 07 දක්වා කාල පරාසයක් ගත වී තිබුණ ද, ස්ථාන මාරු වූ, විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් තිදෙනෙකුගේ රු.377,541 ක ණය ශේෂ අය කර ගෙන නොතිබුණි. | ණය මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුදල් අය කර ගැනීමට නීත්‍යානුකූල පියවර ගැනීම සිදු කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු ජල යෝජනා ක්‍රම 06 ක ජලය කිසිදු පිරිසිදු කිරීමකින් තොරව ජල පාරිභෝගිකයින් 575 ක් වෙත බෙදා හැරීමට කටයුතු කර තිබුණි. | පිරිපහදු කළ ජලය ලබා දීමට පියවර ගත යුතු වේ. | මේ වන විට සියලුම ජල යෝජනා ක්‍රමවල ජලය පරීක්ෂා කර ක්ලෝරීන්කරණය කර ඇත. |
| (ආ) | 2013 වර්ෂයේදී, බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගත් ප්‍රදේශ 05 ක දේපළවලින් වරිපනම් බදු අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කරනොතිබුණි. | තක්සේරු අගය මත වරිපනම් බදු අය කර ගත යුතු වේ. | දියුණු කළ ප්‍රදේශ 05 ක් හඳුනා ගෙන ඇති අතර, ඒවා තක්සේරු කර, වරිපනම් බදු අය කිරීමට කටයුතු කරමි. |

3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කැබ් රථයේ ලියාපදිංචි කිරීමේ පොත අනුව, තිබූ එන්ජින් අංකයට පරස්පර අංකයක් එහි එන්ජිමේ විය. තව ද, එන්ජිම මාරු කිරීම සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පරීක්ෂා කර අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමා මේ සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදු කරන ලෙස මට ද පිටපත් සහිතව මහනුවර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව සඳහන් කරමි. |

3.6 වත්කම් කළමනාකරණය

3.6.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පහත මහලේ අංක 01 කඩ කාමරය විධිමත් නොවන ආකාරයට බාහිර පාර්ශවයකගේ භාවිතයට ඉඩ හැර තිබුණි. | සභාව සතු දේපළ විධිමත්ව පැවරිය යුතු වේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |
| (ආ) | පවරා නොගත් වත්කම්<br>සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්ගත කර තිබූ සභාවට අයිතිය නොමැති වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී, කටයුතු කරමි. |

3.6.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු රු.4,960,516 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 11ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගත යුතු වේ. | රථ 02 ක් ඉදිරියේ දී, අලුත්වැඩියා කර භාවිතා කරන බවත්, තවත් රථ 07 ක් වෙන්දේසි කිරීමට කටයුතු කරන බවත්, එක් ට්‍රැක්ටරයක් ආගරපතන ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බව හා ගැල්වනයිස් බට ආදායම් ඉපයීම සඳහා යොදවන බවත්, දන්වමි. |

3.7 ප්‍රසම්පාදනය

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රු.58,836,218 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2018 වර්ෂයේ පිළියෙල කර නොතිබූ අතර, 2019 වර්ෂයේ සකස් කර ඇත. |

3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගන්නෝරුව බටහිර පූට්ටු පාලම අසලින් ඇල වේල්ල සංවර්ධනය කිරීමේ දී, අනුමැතිය ලබාගැනීමකින් හා අධීක්ෂණයකින් තොරව ඇස්තමේන්තු ප්‍රකාරව ඉදිකළ යුතු දිග මී.9.10 ක් වූ රැඳවුම් බැම්ම වෙනුවට දිග මී.10.06 ක රැඳවුම් බැම්මක් ඉදිකර තිබුණි. රැඳවුම් බැම්මේ එක් එක් ස්ථරයක උස මීටර් 0.45 ක් විය යුතු වුවත්, මිණුම්පොතට අනුව, එහි උස මීටර් 0.35 ක් පමණක් වූ බැවින්, බැම්ම අඩියක් පමණ උසින් අඩු වුවත්, ඇස්තමේන්තු අනුව, ඉදිකිරීම සිදු නොකර, රු.111,843 ක්ගෙවා තිබුණි. | ඇස්තමේන්තුව අනුව, ඉදිකිරීම් සිදු කළ යුතු වේ. | සැලසුම්වලට අනුව, ඉදිකිරීමේ දී වෙනස්කම් සිදු වී ඇති අතර, වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ නිසි ක්‍රමවේදයක් සකස් කර ගැනීම සිදු කරමි. |